LIVEWORKSHEETS

# අන්තර්ක්‍රියාකාරී වැඩ පත්‍රිකාවක් හදමු

H.M.Wijewardana – Rambuka M. V.

ඔබගේ සාම්ප්‍රදායික මුද්‍රණය කළ හැකි වැඩ පත්‍රිකා (doc, pdf, jpg ...) ස්වයං නිවැරදි කිරීම් සමඟ අන්තර්ක්‍රියාකාරී මාර්ගගත අභ්‍යාස බවට පරිවර්තනය කිරීමට සජීවී වැඩ පත්‍රිකා ඔබට ඉඩ සලසයි, එය අපි "අන්තර්ක්‍රියාකාරී වැඩ පත්‍රිකා (Interactive Worksheets)" ලෙස හඳුන්වමු.

සිසුන්ට වැඩ පත්‍රිකා මාර්ගගතව(Online) කළ හැකි අතර ඔවුන්ගේ පිළිතුරු තමාම පරීක්ෂා කරගැනීම හෝ ඒවා ගුරුවරයා වෙත යැවීම කළ හැකිය.

මීට අමතරව, මෙම අන්තර්ක්‍රියාකාරී වැඩ පත්‍රිකා අධ්‍යාපනයට යොදන නව තාක්ෂණයන්ගෙන් පරිපූර්ණය. ඒවාට ශබ්ද, වීඩියෝ, ඇදගෙන ගොස් දැමීමේ(drag and drop) අභ්‍යාස, ඊතල සමඟ සම්බන්ධ කිරීම, බහුවරණ ... සහ කථන අභ්‍යාස වැනි දේ ඇතුළත් කළ හැකිය.

### *මම එය භාවිතා කරන්නේ කෙසේද?*

ඔබේම අන්තර්ක්‍රියාකාරී වැඩ පත්‍රිකා සෑදීම සඳහා ඔබට මෙම වෙබ් අඩවිය භාවිතා කළ හැකිය, නැතහොත් වෙනත් ගුරුවරුන් විසින් බෙදාගත්(Share කළ) ඒවා භාවිතා කළ හැකිය. භාෂා සහ විෂයයන් රාශියක් ආවරණය වන අන්තර්ක්‍රියාකාරී වැඩ පත්‍රිකා දහස් ගණනක එකතුවක් වෙබ් අඩවිය සතුව ඇත.

### *මෙය නොමිලේ භාවිතයේදී යම් සීමාවක් තිබේද?*

ඔබ ඔබේ අන්තර්ක්‍රියාකාරී වැඩ පත්‍රිකා සෙසු ගුරුවරුන් සමඟ බෙදා(Share කර) ගන්නේ නම්, ඔබට කැමති තරම් ප්‍රමාණයක් සෑදිය හැකි අතර, එයට අපි ඉතා කෘතඥ වෙමු.
ඔබට ඔබේ වැඩ පත්‍රිකා පෞද්ගලිකව තබා ගත හැකි නමුත්, පුද්ගලික වැඩ පත්‍රිකා 30 ක සීමාවක් ඇත.

### *මගේම අන්තර්ක්‍රියාකාරී වැඩ පත්‍රිකා සාදා ගන්නේ කෙසේද?*

එය ඉතා පහසුය. මූලික වශයෙන්, ඔබ ඔබේ (doc, pdf, jpg ...) ලේඛනය උඩුගත(Upload) කළ යුතුය. එය රූපයක් බවට පරිවර්තනය වේ. ඉන්පසු ඔබ වැඩ පත්‍රිකාවේ ක්‍රියාකාරකම් යෙදිය යුතු ස්ථානවල කොටු ඇඳීම සහ ඒවා තුළ ක්‍රියාකාරකමට අදාල සරල විධානයන්(Commands) ඇතුළත් කිරීම කළ යුතුය.

ඇදගෙන යාම සඳහා - drag:1 , drop:1 ඊතල මගින් සම්බන්ධ කිරීම සඳහා - join:1 , join:1
බහුවරණ අභ්‍යාස සඳහා - select:yes , select:no වැනි ඔබ ඉගෙන ගත යුතු විධානයන් කිහිපයක් ද ඇත.
නමුත් එය ඉතා පහසුය. ඔව්, ඔබ මවිත වන තරම් පහසුය.

"ඊ-නැණ පියස" සඳහා Liveworksheets ඇසුරින් සකස් කළ පාඩම් කීපයක යොමු(Links) උදාහරණ ලෙස මෙහි ඇතුළත් කළෙමු. එම පාඩම් වෙත පිවිස බලන්න.






LIVEWORKSHEETS